## 1995 අංක 01 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය :

දකුණු පළාතේ සුළු, මධ්‍යම හා මහා පරිමාන කර්මාන්ත, කෘෂිකර්මාන්ත, සහ සත්ව පාලනය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහාත්, ඊට සම්බන්ධ හෝ ආනුශාංගික වෙනත් කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ, 1995 අංක 1 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

### 1 වැනි කොටස

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය, අරමුණු, බලතල හා කාර්ය ආදිය.

02. (මෙහි මින්මතු "අධිකාරි" ලෙස සඳහන් කරනු ලබන) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය නමින් හඳුන්වන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ. දකුණු පළාත්සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

03. අධිකාරිය 02 වැනි වගන්තියෙන් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් වන්නේය. තවද ඊට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතු අතර, එකී නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීමද ඊට විරුද්ධව නඩු පැවරීමද කළ හැකිය. අධිකාරිය සංස්ථාවක් වන බව

04. අධිකාරියේ අරමුණු පහත සඳහන් වේ .- අධිකාරියේ අරමුණු

(අ) දකුණු පළාත තුළ සුළු, මධ්‍යම හා මහා පරිමාන කර්මාන්තවලට, කෘෂි කර්මාන්තයට සහ සත්ව පාලනයට සහ ඒ ආශ්‍රිත කර්මාන්ත වලට අනුබලදීම සහ ඒවා පවත්වා ගෙන යාම හා ඒවා දියුණු කිරීම සඳහා අවස්ථා සැලසීම.

(ආ) දේශීය හා විදේශීය ආයෝජකයන් දකුණු පළාත තුළ ආයෝජනය සඳහා දිරිගැන්වීමෙන් හා ඵලදායී ව්‍යාපෘති හඳුන්වා දීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් එවැනි ආයෝජකයන්ට සහායවීම.

(ඇ) පෙළඹවීම් ක්‍රම හා වේගවත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ මූලික පහසුකම් වලින් හෙබි හිතකර ආයෝජන වාතාවරණයක් දකුණු පළාත තුළ ඇති කිරීම.

(ඈ) දකුණු පළාත තුළ ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනීය කටයුතු කරගෙන යාම, පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම, දැනුම හා තොරතුරු පතුරුවාලීම සහ වෙනත් වැඩ සටහන් ඇති කිරීම සහ පර්යේෂණ හා සංවර්ධනාත්මක කටයුතු මෙහෙයවීම.

(ඉ) දකුණු පළාත තුළ නිෂ්පාදිත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳ පොලවල් ඇති කිරීම සහ දේශීය හා විදේශීය වෙළඳපොල පහසුකම් සලසා දීමට අවශ්‍ය අලෙවිකරන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම,

(ඊ) දකුණු පළාතේ අලෙවිකරණය සම්බන්ධයෙන් ආධාර අපේක්ෂා කරන දේශීය නිෂ්පාදකයින්ගෙන් ලැබෙන ඉල්ලීම් ගැන ක්‍රියා කිරීම හා දේශීය හා විදේශීය අලෙවි අවශ්‍යතා ඇති අංශවල නිෂ්පාදකයන් දිරි ගැන්වීම,

(උ) දකුණු පළාතේ සුළු, මධ්‍යම හා මහා පරිමාන කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය සහ සත්ව පාලනය යන ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාවනට ගැලපෙන ආකාරයේ ශිල්ප ඥානය ඇති කර ගැනීම, නවීකරණය පිළිබඳව උපදෙස් දීම හා මඟ පෙන්වීම සහ එවැනි ශිල්ප ඥානය සංවර්ධනය කිරීමට හා පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට මූල්‍යාධාර ලබා දීම හා දකුණු පළාතේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂිකාර්මික සහ සත්ව පාලන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතු වලට අනුග්‍රහය දැක්වීම සහ ඒවා භාර ගැනීම,

(ඌ) දකුණු පළාතේ ක්‍රියාත්මක සංවර්ධනය හා කාර්ය සාධකතාව වැඩිදියුණු කිරීම සහ කළමණාකරණය හා නිෂ්පාදනය හා බෙදා හැරීම පිළිබඳ නව ක්‍රම උපයෝගී කර ගැනීම සඳහා අනුබල දීම,

(එ) දකුණු පළාතේ ඉහත සඳහන් එක් එක් කර්මාන්ත අංශ උදෙසා නිශ්චිත කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාත්මක සැලසුම් වර්ධනය කිරීම,

අධිකාරියේ බලතල හා කාර්ය

05. අධිකාරියට පහත සඳහන් බලතල සහ කාර්ය ඇත්තේ ය.

(අ) අධිකාරියේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපලක් අවශ්‍ය වුවහොත් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව ඒ දේපල අත්කර ගැනීම ;

(ආ) සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂි කර්මාන්තය සහ සත්ව පාලනය දිරිගැන්වීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ඇ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, දේශීය හා විදේශීය වශයෙන් ගිවිසුම්වලට හෝ සහයෝගිතා ගිවිසුම්වලට හෝ ඇතුළත්වීම ;

(ඈ) සුළු, මධ්‍යම හා මහා පරිමාන කර්මාන්ත සහ කෘෂි කර්මාන්තය හා සත්ව පාලනය යන අංශ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහායවීම, සම්බන්ධීකරණය කිරීම හා අනුබල දීම ;

(ඉ) ඉහත දක්වෙන මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩ සටහන්, ව්‍යාපෘති, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය සංවිධානය කිරීම හා මෙහෙයවීම ;

(ඊ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලයට ගැනීම, තබාගැනීම, බද්දට, උගසට හෝ කුලියට ගැනීම හෝ දීම, ඇපයට තැබීම, උගස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(උ) අධිකාරියේ අරමුනු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, උපකරණ, අමුද්‍රව්‍ය හෝ වෙනත් දේශීය වශයෙන් මිලට ගැනීම හෝ ආනයනය කිරීම ;

(ඌ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන වියදම් ගෙවීම;

(එ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ දේශීය, විදේශීය හා අන්තර් ජාතික ආයතන මගින් සපයනු ලබන මූල්‍ය ආධාර, ද්‍රව්‍යමය ආධාර, උපදේශක සේවා හෝ වෙනත් යම් ආකාරයක ආධාර ලබාගැනීම

(ඒ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයතන හෝ පුද්ගලයන් සමග ඒකාබද්ධ හවුල් ව්‍යාපාර, ඒකාබද්ධ ව්‍යාපෘති ආදිය සැලසුම් කිරීම, පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඔ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය කර ගැනීම සහ අවශ්‍ය වුවහොත් බැංකු, මූල්‍ය ආයතන හෝ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන වලින් ණය මුදල්, අයිරා පහසුකම් ආදිය ලබා ගැනීම ;

(ඕ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ව්‍යාපාර ආරම්භ කිරීම හා අධිකාරියේ මෙහෙයවීම යටතේ ආරම්භ කෙරෙන රැකියා උත්පාදන ව්‍යාපෘති, ස්වයං රැකියා ව්‍යාපෘති හා වෙනත් ව්‍යාපෘති සඳහා ණය මුදල් සැපයීම ප්‍රාග්ධනය සඳහා දායකවීම, උපකරණ හා වෙනත් පහසුකම් ලබාදීම හා එබඳු මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දී ඇපකරුවන් ලෙස කටයුතු කිරීම ;

(ක) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යම් ගොඩනැගිලි ඉදිකිරීම, මිලයට ගැනීම හෝ අළුත්වැඩියා කිරීම හෝ පවත්වාගෙන යාම සහ යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම. රැස්කිරීම සහ අලෙවි කිරීම

(ඛ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන විවිධ වෘත්තිමය ආයතන ව්‍යවස්ථාපිත ආයතන යම් සංඛ්‍යාවක් අධිකාරිය විසින් ස්ථාපනය කර, පවත්වාගෙන යාම ;

(ග) අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම ;

(ඝ) අධිකාරිය ඉටු කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම ;

(ච) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කරන නිලධාරීන්, සේවා නියුක්තයන් සහ සේවකයන් පත්කර ගැනීම, සේවයේ යෙදවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම, ඔවුන් පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ නිවාඩු ;

(ඡ) අධිකාරියේ, නිලධරයන් සේවා නියුක්තයන් හා සෙසු සේවකයන් සඳහා සේවක අර්ථසාධක යෝජනා ක්‍රම ඇති කිරීම.

අධිකාරියේ නියෝජිතායතන හා අංශය

06. තම අරමුණු සාර්ථකව ඉටුකිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය නියෝජිතායතන සහ අංශ දේශීය හා විදේශීය වශයෙන් පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

## II වන කොටස

### අධිකාරියේ කළමණාකරණය සහ එහි සංයුතිය

කළමණාකාර මණ්ඩලය

[illegible] (1) අධිකාරිය සඳහා නිල බලයෙන් පත්වෙන සාමාජිකයන් අටදෙනෙකුගෙන්ද පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන්ද සමන්විත වන (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයක් තිබිය යුතුය.

(2) මණ්ඩලයේ නිල බලයෙන් පත්වන සාමාජිකයන් පහත සඳහන් පරිදි වේ :-

(අ) දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම ලේකම් ;
(ආ) දකුණු පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ;
(ඇ) දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
(ඈ) කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකාරවරයා ;
(ඉ) අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත්කරනු ලබන නියෝජිතයෙක් ;
(ඊ) ගාල්ලේ වෙළඳ මණ්ඩලයේ සභාපති ;
(උ) මාතර වෙළඳ මණ්ඩලයේ සභාපති ;
(ඌ) හම්බන්තොට වෙළඳ මණ්ඩලයේ සභාපති.

3. (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" ලෙස සඳහන් කරනු ලබන) අධිකාරියේ විෂයන්ට අදාල අංශයන්හි නිපුණත්වයක් හා ක්‍රියාශීලීව නියැලෙන තැනැත්තන් ලෙස අමාත්‍යවරයා සලකන සාමාජිකයන් 7 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත්කළ යුතුය.

4. අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපති ලෙස ඉහත කී සාමාජිකයන් අතුරින් කෙනෙකු පත් කළ යුතුය..

පත්කළ සාමාජිකයන්ගේ ධූර කාලය

08. පත්කළ සාමාජිකයකු ඉල්ලා අස්වීම නිසා හෝ මරණය නිසා හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ කලින් තම ධූරය හිස් කළහොත් හැර ඔහු පත් කළ දින සිට අවුරුදු තුනක් ධූරය දැරිය යුතුය.

පත්කළ සාමාජිකයකු නැවත පත්කරනු ලැබීමට ඇති සුදුසුකම්

09. කාලය ඉකුත්වීම නිසා ධූරය හිස් කරන යම් පත් කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

පත්කළ සාමාජිකයකු ඉල්ලා අස්වීම

10. අමාත්‍යවරයා අමතන ලිපියකින් ඕනෑම වේලාවක තනතුරෙන් ඉල්ලා අස්වීමට පත්කළ සාමාජිකයෙකුට හැකිය.

පත්කළ සාමාජිකයා ධූරයෙන් ඉවත් කිරීම

11. කිසිම හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කළ හැකිය.

නුසුදුසුකම්

12. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ අපරාධ නීතිය යටතේ හෝ මුදල් වංචා සම්බන්ධයෙන් අධිකරණයේ වරදකරුවෙකු වූ (විශ්වාසය කඩකිරීම හා බංකොලොත්භාවයට පත් වූ) උයද ඇතුලත්ව මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම වැඩ කිරීමට සුදුසුකම් නොලබන්නේය.

වැඩ බලන සාමාජිකයකු පත් කිරීම

13. යම් සාමාජිකයකු රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධූරය කටයුතු ඉටු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් මෙහි වෙනත් විධි විධාන වලට යටත්ව එකී සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකිය.

මණ්ඩලයේ රැස්වීම්

14. මණ්ඩලය මසකට අවම වශයෙන් එක් වරක්වත් හෝ රැස්විය යුතුය.

ගණපූර්ණය

15. මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූර්ණය සභපතිවරයා ද ඇතුළුව සාමාජිකයින් පස්දෙනෙකු වන්නේය.

මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පරිපාටිය

16. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් හා එම රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිණිස මණ්ඩලය විසින් සිය කාර්ය පරිපාටිය නියෝග මගින් සකස් කරගත හැකිය.

මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීම දෝෂ සහිත වී ... මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් හෝ බල රහිත යැයි සලකනු නොලැබිය යුතුය.

පාර්ලිමේන්තු සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබ ... අනුව මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවිය හැකිය.

(1) අධිකාරියේ පොදු මුද්‍රාව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ තිබිය යුතුය.

(2) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට හැර අධිකාරියේ පොදු මුද්‍රාව යම් සාධන පත්‍රයක ලියවිල්ලක හෝ නොයෙදිය යුතු අතර, එම සාමාජිකයින් දෙදෙනා එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණ වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි හෝ ලියවිල්ලෙහි තම අත්සන යෙදිය යුතුය.

(3) අධිකාරියේ පොදු මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලියවිලි හෝ පිළිබඳ ලේඛනයක් මණ්ඩලය වි පවත්වාගෙන යා යුතුය.

මණ්ඩලය තම බලතල ක්‍රියාත්මක කිරීමේදී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ කටයුතු කිරීමේදී අමාත්‍යවරයා වි ... ලැබිය හැකි පොදු හෝ නිශ්චිත විධිවිධාන වලට මණ්ඩලය යටත් වන අතර, එම උපදෙස් අනුව ... මණ්ඩලය බැඳී ඇත්තේය.

(1) මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක් මණ්ඩලයේ යම් සාමාජිකය හෝ අධිකාරියේ යම් නිලධරයකුට මණ්ඩලය විසින් පැවරිය හැකිය.

(2) එවැනි බලතල, කර්තව්‍ය හෝ කාර්ය පවරනු ලැබූ යම් සාමාජිකයකු හෝ නිලධරයකු විසින් ඒවා මණ්ඩ සාමාන්‍ය හා විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

## *III* වන කොටස

### අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා හා සෙසු කාර්ය මණ්ඩලය

(1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් පැවරෙන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කි සහ ඉටු කිරීමට උචිත සුදුසුකම් ඇති අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් හඳුන්වනු ලබන පූර්ණක නිලධරයකු මණ්ඩලය විසින් පත් කළ යුතුය.

(2) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික අධ ජනරාල්වරයාට ගෙවිය යුතු අතර මණ්ඩලයේ විධානවලට හා උපදෙස් වලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල් විසින් බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය.

(1) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම් වන අතර, මණ්ඩලයේ රැස්වීම් වලදී ඔහුට ඡන්දයක් හිමි නො

(2) අධිකාරියේ එදිනෙදා සියලුම පරිපාලන කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයට වගකිව තවද, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව,

(අ) අධිකාරිය විසින් සේවයේ යොදවා ගෙන ඇති නිලධාරීන්ගේ සේවා නියුක්තයන්ගේ සහ සේවක කුසලතා වර්ධනය කිරීම ;

(ආ) අධිකාරියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ස කිරීම ;

(ඇ) අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය වන්නාවූ සේවාවන් සංවිධානය කි

(3) මණ්ඩලය විසින් කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි වෙනත් බලතල, ක සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ යුතුය.

24. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව, අධිකාරියේ සෙසු කාර්ය මණ්ඩලය

(අ) අධිකාරියේ නිලධරයන්, සේවා නියුක්තයන් සහ සේවා පත් කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම ඔවුන්ගේ විනය පාලනය ගැන ක්‍රියා කිරීම.

(ආ) එම කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් කාර්ය පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තීරණය කිරීම, මණ්ඩලය විසින් කළ හැකිය.

## IV වන කොටස

## මුදල් හා ගිණුම

25.(1) (මෙහි මින් මතු 'ගිණුම' යනුවෙන් සඳහන් කරනු ලබන) "දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ගිණුම" නමින් ගිණුමක් පළාත් සභා අරමුදලෙන් පවත්වාගෙන යා යුතුය. අධිකාරියේ ගිණුම

(2) එකී ගිණුම සඳහා ලැබෙන පහත දැක්වෙන ලැබීම් ප්‍රථමයෙන් පළාත් සභා අරමුදලට ගෙවා ඉන්පසුව ගිණුමට හර කළ යුතුය.

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් හා ත්‍යාග.

(ආ) අනෙකුත් ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(ඇ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ආයතනයක් විසින් නීත්‍යානුකූලව අධිකාරියට දෙනු ලබන සියලු මුදල් ; සහ

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී අධිකාරියට ලැබෙන මුදල්.

26. අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේලා, බලතල ක්‍රියාත්මක කිරීමේලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේලා මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් කරනු ලබන වියදම් පියවීමට සහ ගිණුමෙන් ගෙවිය යුතු ලෙස මේ ප්‍රඥප්තියේ සඳහාත් වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ගිණුමෙන් ගෙවනු ලැබිය යුතුය. ගිණුමේ මුදල් යෙදවීම

27. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ විධිවිධාන වලට යටත්ව ගිණුමේ ප්‍රධාන පරිපාලක නිලධරයා වන්නේය. පාලනය

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 වන කොටසේ විධිවිධාන වලට යටත්ව ගිණුම් පවත්වා ගෙන යා යුතුය.

28. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වේ. අධිකාරියේ මුදල් වර්ෂය

(2) අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් ගිණුමේ ලැබීම් සහ ගෙවීම් හා වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යා යුතුය.

29. (1) අධිකාරියේ මුදල් වර්ෂය අවසන් වී මාස 6 ක් ඉකුත් වීමට පෙර අදාල මුදල් වර්ෂය වෙනුවෙන් ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අභ්‍යන්තර විගණන අංශයට නිරන්තරයෙන් විගණන කටයුතු කරගෙන යාමට බලය පැවරේ. එකී ගිණුම් විගණනය සඳහා ඔහුට සහායවීම පිණිස විගණකාධිපතිවරයා විසින් ඔහුගේ මග පෙන්වීම හා පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම් ලත් විගණකාධිපතිවරයකුගේ හෝ විගණනවරුන්ගෙන් හෝ සේවය ලබාගත හැක.

(2) අධිකාරියේ ගිණුම් විගණන සඳහා ගෙවිය යුතු ගාස්තුවක් වෙතොත් එම ගාස්තුව අධිකාරියේ ගිණුමෙන් දැරිය යුතුය.

(3) විගණකාධිපතිවරයා විසින් හෝ අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා ඔහුට සහාය වන යම් තැනැත්තකු විසින් හෝ එම විගණනයේ කාර්ය සඳහා අවශ්‍ය වන සියළුම පොත්පත්, ඔප්පු හා වෙනත් සාධන පත්‍ර, ගිවිසුම් ලේඛන, වවුචර් හා වෙනත් ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැකි අතර ඒවා සැපයීම හා විගණනය සඳහා අවශ්‍ය තමා දන්නා කවර හෝ තොරතුරක් සැපයීම මණ්ඩලයක් හෝ එහි සාමාජිකයකු සතු කාර්යය වන්නේය.

(4) මෙම වගන්තියේ "සුදුසුකම් ලත් විගණනවරයා" යනුවෙන්,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේද, එමෙන් ගණකාධිකාරීවරයා වශයෙන් වෘත්තීයෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ල සහතිකයක් දරන්නේද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ අදහස් වේ.

30 විගණකාධිපතිවරයා විසින් ගිණුම පරීක්ෂා කොට පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු

(අ) තමන්ට අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුනේද නැද්ද යන වග,

(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳව නිවැරදි හා සාධාරණ අදහසක් ලබාගැනීමට හැකිවන පරිදි ගිණු නිසියාකාරව පවත්වා ගෙන ගොස් තිබෙන්නේද යන වග,

(ඇ) තමන්ගේ හැඟීම් අනුව පළාත් සභාවට වැදගත් වන යම් කරුණු, ගිණුම විගණනය කිරීමේදී හෙළිද වූයේ නම් ඒ කරුණු.

31 විගණනය කරන ලද ගිණුම හා විගණකාධිපතිවරයාගේ වාර්තාව, එක් එක් වර්ෂයේදී ලැබුණු විට එම වාර්ත ... අදාල මුදල් වර්ෂය තුලදී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක්ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරි ... ඔහු විසින් අදාල මුදල් වර්ෂය ඉකුත්වී දොළොස් මසක් ඉකුත්වීමට පළමු ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩල ... ඉදිරිපත් කිරීමට සැළැස්විය යුතුය.

## V වන කොටස

## පොදු කරුණු

32 (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියමිත කරුණු සඳහාත්, නියෝග සෑ ... යුතු යයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් කරුණක් සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැ

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එය පළවූ දින සිට හෝ එම නියෝගයේ සඳහන් ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වේ.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ඒවා ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුම සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් වෙතොත් එය අනු කරනු නොලැබූ දින සිට අවලංගු වූවා සේ සැළකිය යුතු නමුත් එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියා හෝ තීරණයක් කෙරෙහි එම අවලංගු වීම බල නොපෑ යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝග එසේ අවලංගු වූවා සේ සැළකිය යුත්තේ කවර දිනක සිටද යන්න පිළිබඳව දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ කළ යුතුය.

33 (1)(අ) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයේ සාමාජිකයකු සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට විරුද්ධව හෝ,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට අධිකාරියේ යම් නිලධරයකු සේවා නියුක්තයකු සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සළකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධ ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවා නියුක්තයාට හෝ සේවකයාට විරුද්ධව, කිසිම සිවිල් හෝ අ නඩුවක් නොපැවරිය යුතුය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අ නඩුවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් අධිකාරියේ වියදමින් ගෙවනු ලැබිය යුතු එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය වෙත ගෙවනු ලබන හෝ අධිකාරිය විසින් අය ලබන යම් ගාස්තුවක් ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

(3)(1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩ විධානය පිට කරන ලදැයි සළකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේදී විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී ඔහු විසින් දරන යම් වියදමක්, ඒ සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අ නඩුවේදී අයකර ගනු ලැබුවේ නම් මිස, ගිණුමින් ගෙවනු ලැබිය යුතුය.

අධිකාරියේ නිලධරයන් ... නිලධරයන් ලෙස සැලකෙන බව

34 අධිකාරියේ සියළුම නිලධරයන්, සේවා නියුක්තකයන්, සේවකයන් හා මණ්ඩලයේ සියළු සාමාජිකයන් ... නීති සංග්‍රහයේ අර්ථානුකූල හා (1) දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලබ

35. මෙම ප්‍රඥප්තියේ අන්‍යාකාර විධිවිධාන සලස්වා තිබේ නම් හැර "අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වේ. අර්ථ නිරූපනය.

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාතේ, පළාත් සභාව අදහස් වේ.

"පළාත් සභා අරමුදල" යන්නෙන් දකුණු පළාතේ, පළාත් සභා අරමුදල අදහස් වේ.

"පළාත" යන්නෙන් දකුණු පළාත අදහස් වේ.

36. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පාඨය බල පවත්නේය. අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පාඨය බලපැවැත්විය යුතු බව

[illegible]-786

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.